*සැ. යු.* - 2018.09.14 දින පළ වූ අංක 2,089 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,090 - 2018 සැප්තැම්බර් මස 21 වැනි සිකුරාදා - 2018.09.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1412 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 1424 |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* -(i) ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන (සංශෝධන) පනත් කෙටුම්පත 2018 සැප්තැම්බර් මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ණය සහනදායක (සංශෝධන) පනත් කෙටුම්පත 2018 සැප්තැම්බර් මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 ඔක්තෝබර් මස 12 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 සැප්තැම්බර් 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## නුවරඑළිය ප්‍රාදේශීය සභාව

### ප්‍රාථමික ශ්‍රේණියේ ශිල්පීය, අර්ධ ශිල්පීය, ශිල්පීය නොවන තනතුරු සඳහා බඳවා ගැනීම

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති, නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් 2018.10.05 දිනට පෙර ලේකම්, නුවරඑළිය ප්‍රාදේශීය සභාව, කදපොල යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ විසින් ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. තනතුරු කිහිපයකට ඉල්ලුම්කරන්නේ නම් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් යොමු කළ යුතුය.

<table>
<tr><th>අනු. අංකය</th><th>තනතුරු නාමය</th><th>තනතුරු සංඛ්‍යාව</th><th>අනුයුක්ත කරන ස්ථානය</th><th>වැටුප් පරිමාණය</th><th>අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්</th></tr>
<tr><td>01</td><td>රියැදුරු<br>III වන ශ්‍රේණිය</td><td>02</td><td>නුවරඑළිය ප්‍රාදේශීය සභාව</td><td>PL – 03 2016<br>රු. 25,790 - 10x270 – 10x300 – 10x330 –12x350<br>රු. 38,990/-</td><td>අධ්‍යාපන සුදුසුකම් :<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත් වී තිබිය යුතුය.<br><br>වෘත්තීය සුදුසුකම් :<br>තාර බර හොණ්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියැදුරු බලපත්‍රයක් එනම් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියැදුරු බලපත්‍රය අනුව ඒ1 / ඒ / බී1 / බී / සී1 / සී / සීඉ / ඩී1 / ඩී/ජී1 / ජී / ජේ පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම<br><br>පළපුරුද්ද :<br>මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුය.)<br><br>කායික සුදුසුකම් :<br>අවම උස අඩි 05 අඟල් 02 1/2 ක් විය යුතු ය.<br>මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br>මාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය.<br><br>බඳවා ගැනීමේ ක්‍රමය :<br><table><tr><th>ධාරාව</th><th>ප්‍රතිශතය</th></tr><tr><td>විවෘත</td><td>70%</td></tr><tr><td>සීමිත</td><td>30%</td></tr></table></td></tr>
</table>

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | අනුයුක්ත කරන ස්ථානය | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 02 | ආයුර්වේද ඖෂධ සංයෝජක III වන ශ්‍රේණිය | 01 | ආයුර්වේද මධ්‍යස්ථානය කදපොල | PL – 2- 2016 රු. 25,250 - 10x270 – 10x300 – 10x330 –12x350 – රු. 38450 | **අධ්‍යාපන සුදුසුකම් :** අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල හෝ දෙමළ භාෂාව සමග, අවම වශයෙන් විෂයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම.<br><br>**ශිල්පීය නිපුණතා / ප්‍රවීණතා**<br>වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකම් 02 වන මට්ටමේ (NVQ 2) හෝ 3 වන මට්ටමේ (NVQ 3) සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;<br>*හෝ*<br>ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදළව එක් වසරක පාඨමාලාවක් හදරා සහතිකය ලබා තිබීම;<br>*හෝ*<br>තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.<br><br>**පළපුරුද්ද**<br>අදාළ ක්ෂේත්‍රයේ ලබා තිබීම (පුහුණු කාල සීමාව යටත් පිරිසෙයින් අවුරුදු 02 ක් වත් විය යුතුය.) |
| 03 | මාර්ග කම්කරු III වන ශ්‍රේණිය | 10 | නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | PL – 1- 2016 රු. 24,250/- 10x250 – 10x270 – 10x300 – 12x330 - රු. 36,410 | **අධ්‍යාපන සුදුසුකම්:**<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග යේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයන් 05 ක් එක් වරකදී සමත්වී තිබිය යුතුය. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථා වලදී 5 ශ්‍රේණිය සමත් අයවලුන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *අනුයුක්ත කරන ස්ථානය* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 04 | සෞඛ්‍ය කම්කරු III වන ශ්‍රේණිය | 12 | නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | PL – 01- 2016 රු. 24,250/- 10x250 – 10x270 – 10x300 – - 12x330 රු. 36,410/- | **අධ්‍යාපන සුදුසුකම් :** අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග යේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයන් 05 ක් එක් වරකදී සමත්වී තිබිය යුතුය. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමති අවස්ථාවලදී 5 ශ්‍රේණිය සමත් අයවලුන් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 05 | කාර්යාල කාර්ය සහායක III වන ශ්‍රේණිය | 02 | නුවරඑළිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය උපකාර්යාලය | PL – 01- 2016 රු. 24,250/- 10x250 – 10x270 – 10x300 – - 10x330 - රු. 36,410/- | **අධ්‍යාපන සුදුසුකම් :** අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග යේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයන් 05 ක් එක් වරකදී සමත්වී තිබිය යුතුය. |
| 06 | මුරකරු III වන ශ්‍රේණිය | 01 | | රු. 24,250/- 10x250 – 10x270 – 10x300 – - 10x330 - රු. 36 ,410/- | **අධ්‍යාපන සුදුසුකම් :** අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග යේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයන් 05 ක් එක් වරකදී සමත්වී තිබිය යුතුය. |
| 07 | ජල කම්කරු III වන ශ්‍රේණිය | 06 | කඳපොල ගල්පාලම නානුඔය | PL – 01- 2016 රු. 24,250/- 10x250 – 10x270 – 10x300 – - 12x330 - රු. 36,410/- | **අධ්‍යාපන සුදුසුකම් :** අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග යේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයන් 05 ක් එක් වරකදී සමත්වී තිබිය යුතුය. |

***සටහන*** - *ගැසට්* නිවේදනයේ සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් මෙම බල ප්‍රදේශය තුලින් ඉදිරිපත් වී නැතිනම් ආසන්න බල ප්‍රදේශවල අයදුම්කරුවන්ගේ අයදුම්පත් සම්බන්ධයෙන් සලකා බලනු ලැබේ.

02. බඳවා ගැනීමේ කොන්දේසි :

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරුවන් මනා මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
3. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර තුනක කාලයක් නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
4. අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ කිසියම් පළාත් රාජ්‍ය සේවයක ස්ථිර සේවයේ නියුක්ත තැනැත්තන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

   ක්ෂේත්‍ර වැඩ පරීක්ෂක තනතුර සඳහා වයස අවු. 18ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි විය යුතුය.
5. ඉහත දක්වා ඇති එක් එක් තනතුරට අදාළව ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

6. බඳවා ගැනීමේ පටිපාටිය අනුව විධිමත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, එහි දී ලබාගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගැනේ.

7. රියදුරු තනතුර සඳහා ඉල්ලුම්කරන අය ලිඛිත පරීක්ෂණයකට ඉදිරිපත් විය යුතු අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති හා ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

සීමිත බඳවා ගැනීමේ දී කායික, මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන, වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමග ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් (අර්ධ ශිල්පීය හා ශිල්පීය නොවන තනතුරු සඳහා) මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයක දී සුදුසුකම් ලබා ගත යුතුය.

8. අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීමේ බලය නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

9. දැනටමත් නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ එම තනතුරුවල අනියම්, ආදේශක, දීමනා, කොන්ත්‍රාත්, හෝ කුළී පදනම යටතේ සේවයේ නියුතු වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලබන අතර, ඔවුන් ආයතන ප්‍රධානියා මගින් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

10. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලට ද පළාත් පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලට ද නුවරඑළිය ප්‍රාදේශීය සභාව දැනට පනවා ඇති හා පනවනු ලබන නීතිවලට හා එකී නීති රීති සියල්ලට යටත් විය යුතුය.

11. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

1. මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ.)

2. වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

3. බඳවා ගනු ලබන අය වසර 03 ක පරිවාස කාලයකට යටත්ය. එම කාලය තුළදී වැඩ පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කරනු ලැබේ.

4. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව අවශ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා දිය යුතුය.

5. බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ බඳවා ගැනීම සඳහා වන අනෙකුත් පොදු කොන්දේසිවලට යටත් විය යුතුය.

6. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර කවර බල ප්‍රදේශයක් තුළ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යකින් යුක්ත තැනැත්තෙකු විය යුතුය.

7. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

8. රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/ 90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතුය. නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කෙරෙන ස්ථාන මාරුවීම්වලට යටත් වේ.

9. සේවයේ අකාර්යක්ෂමතාවයක් හෝ අසතුටුදායක තත්ත්වයක් පෙනී ගියහොත් සභාවේ මනාපය පරිදි සේවය අවසන් කිරීමේ බලය ප්‍රාදේශීය සභාව සතුය.

04. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත් පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහා එවන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම්කරන තනතුර සඳහන් කර 2018.10.05 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, නුවරඑළිය ප්‍රාදේශීය සභාව, කඳපොල." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. තැපෑලේදී නැති වන හෝ වැරදි ලෙස ලිපිනය ලිවීමෙන් ආපසු හරවා යැවෙන අයදුම්පත් සම්බන්ධයෙන් වග කියනු නොලබන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් ලිපි ලේඛනවල සහතික කළ පිටපත් අමුණා එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය;
2. ජාතික හැඳුනුම්පත;
3. අධ්‍යාපන සහතික;
4. ග්‍රාම නිලධාරි විසින් නිකුත්කළ පදිංචි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ යුතුය.);
5. වෘත්තීය සුදුසුකම් දක්වෙන සහතික;
6. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික;
7. මෑතකදී ලබා ගත් චරිත සහතික 02.

එච්. එම්. ජී. අජිත් පුෂ්පකුමාර,
ලේකම්,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස 04 වැනි දින.

**නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ .......................................................................... තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. සම්පූර්ණ නම :————————————————.
02. ලිපිනය :————————————————.
03. දුරකථන අංකය:————————————————.
04. උපන් දිනය :————————————————.
05. ජාතික හැඳුනුම්පත් අංකය :————————————————. (ඡායා පිටපත් ඇමිණිය යුතුය)
06. 2018 ................................ දිනට වයස :——————————
07. පුරවැසිභාවය :————————————————.
08. විවාහක ද / අවිවාහක ද යන වග :————————————————.
09. දැනට තනතුරක් දරන්නේ නම් එම විස්තර :
    (i) තනතුරේ නම :————————————————.
    (ii) එයට පත් වූ දිනය :————————————————.
    (iii) පත්වීමේ ස්වභාවය (ස්ථිර/ අනියම්/ තාවකාලික) :————————————————.
    (iv) මැතිවරණ කොට්ඨාසය :————————————————.
    (v) පළපුරුද්ද හා සේවා කාලය :————————————————.

10. අධ්‍යාපන සුදුසුකම් :-
(සමර්ථ වී ඇති උපරිම ශ්‍රේණිය සඳහන් සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වර්ෂය :—————— විභාග අංකය :——————

| අනු. අංකය | විෂයය | සාමාර්ථය | අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

11. වෘත්තීය සුදුසුකම් :——————————.
12. වෙනත් සුදුසුකම් :——————————.
(තාක්ෂණික දැනුම පිළිබඳ සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද :——————————

14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්තව සිටී ද? ඔව්/ නැත :——————————.
ඔව් නම් දැනට දරන තනතුර හා එම තනතුරට පත් වූ දිනය :——————————.

ඉහත සඳහන් අංක 01 - 14 දක්වා කරුණු සත්‍ය හා නිවැරදි බවට සහතික කරන අතර යම් විටකදී මෙම තොරතුරු අසත්‍ය බව හෙළි වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව තේරුම්ගෙන ඇති බවත්, ඉල්ලුම්පත්‍ර කැඳවීමේ කොන්දේසි වලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

........................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය ෘ .......................... .

*දැනට රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ................................................................................ යන අය මෙම ආයතනයේ ............................................ වශයෙන් ................................................ දින සිට සේවය කරනු ලබයි. ඉල්ලා ඇති තනතුරට තෝරා ගතහොත් ඔහු / ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැක / නොහැක. ඔහු / ඇය කිසිම නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

. .............................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන,
නිල මුද්‍රාව.

දිනය ෘ ............................

නම :——————————.
තනතුර :——————————.
ආයතනය :——————————.

09 - 488

---

## යටිනුවර ප්‍රාදේශීය සභාව

### මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

යටිනුවර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| සේවා ගණය | ෘ | ප්‍රාථමික ශිල්පීය |
| තනතුරු නාමය | ෘ | රියදුරු |
| වැටුප් කේතය | ෘ | PL 03 - 2016 |
| වැටුප් පරිමාණය | ෘ | රු. 25,790 - 10x270 – 10x300 – 10x330 – 12x350 - රු. 38,990/- |
| පුරප්පාඩු සංඛ්‍යාව | ෘ | 02 |

**බඳවා ගැනීමේ ක්‍රමය :**

*බඳවා ගන්නා අනුපාතය :*

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |

**විවෘත බඳවා ගැනීම :**

බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

**සුදුසුකම් :**

*අධ්‍යාපන සුදුසුකම් :*

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත් ව තිබීම, මින් විෂයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි.

*වෘත්තීය සුදුසුකම් :*

බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ ඒ පන්තියේ හෝ බී පන්තියේ රියදුරු බලපත්‍රයක් ලබා තිබීම. ඊට අමතරව යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු සඳහා රජයේ පිළිගත් ආයතනයකින් ලබා ගත් ජාතික වෘත්තීය සුදුසුකම් 4 වෙනි මට්ටම (NVQ - 4) පුහුණු සහතිකය යන්ත්‍ර ක්‍රියාකරවීමේ පුහුණු සහතිකය.

***පළපුරුද්ද :*** මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්ද ලබා තිබීම. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

*කායික සුදුසුකම් :*

I සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

II අවම උස අඩි 05 අඟල් 02 1/2 ක් විය යුතුය.

*වෙනත් සුදුසුකම් :*

I පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
II අයදුම්කරු අදාළ පළාත් පාලන ආයතන බලප්‍රදේශය තුළ වසර 03කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.
III මහා මාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය.
IV බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

*වයස :*

අවම සීමාව අවුරුදු 18 විය යුතු අතර, උපරම සීමාව අවුරුදු 45 විය යුතු වේ.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

*ලිඛිත විභාගය :*

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *මුළු ලකුණු සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 40% |
| 2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 20% |

තරග විභාගයට තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතු වේ.

සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතලිහක්(40%) ලබාගත යුතු වේ.

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 01. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| 02. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |

*වෘත්තීය පරීක්ෂණය :*

| *පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණතාවය/යන්ත්‍ර ක්‍රියාකරවීමේ නිපුණතාවය | 40 | ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියළුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. |
| 2. මහා මාර්ග නීති පිළිබඳව ප්‍රායෝගික දැනුම | 40 | |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | 100 | |

*සීමිත බඳවා ගනීම :*

දැනටමත් අදාළ පළාත් පාලන ආයතනයේ තනතුරක ස්ථිර කර ඇති මූලික සුදුසුකම් සපුරා ඇති සේවකයන් සඳහා අදාළ වේ.

බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

***සුදුසුකම් :***

*අධ්‍යාපන සුදුසුකම් :*

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06ක් සමත් ව තිබීම. මින් විෂයයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි.

*වෘත්තීය සුදුසුකම් :*

බඳවා ගන්නා දිනට වසර 03 කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ ඒ පන්තියේ හෝ බී පන්තියේ රියදුරු බලපත්‍රයක් ලබා තිබීම. ඊට අමතරව යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු සඳහා රජයේ පළිගත් ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් 4 වෙනි මට්ටම (NVQ - 4) පුහුණු සහතිකය යන්ත්‍ර ක්‍රියාකරවීමේ පුහුණු සහතිකය.

*පළපුරුද්ද :* මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්ද ලබා තිබීම.
(පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

*කායික සුදුසුකම් :*

I සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

II අවම උස අඩි 05 යි අඟල් 02 1/2 ක් විය යුතුය.

*වෙනත් සුදුසුකම් :*

I පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
II අයදුම්කරු අදාළ පළාත් පාලන ආයතන බලප්‍රදේශය තුළ වසර 03කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.
III මහා මාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය.
IV බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

*වයස :*

අවම සීමාව අවුරුදු 18 විය යුතු අතර, උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

කායික මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන, වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමග ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයකදී සුදුසුකම් ලබාගත යුතුය.

*ව්‍යුහගත පරීක්ෂණය :*

| *පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණතාවය/යන්ත්‍ර ක්‍රියාකරවීමේ නිපුණතාවය | 40 | ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. |
| 2. මහා මාර්ග නීති පිළිබඳව ප්‍රායෝගික දැනුම | 40 | |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | 100 | |

පහතින් සඳහන් වී ඇති "පොදු කරුණු"මෙම තනතුරට ද අදාළ වේ.

සේවා ගණය : ප්‍රාථමික ශිල්පීය නොවන

වැටුප් කේතය : PL 01 - 2016

වැටුප් පරිමාණය : රු. 24,250/- 10x250 – 10x270 – 10x300 – - 12x330 - රු. 36,410/-

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 01 | පුස්තකාල සහායක | 01 |
| 02 | ජල කම්කරු | 01 |
| 03 | ආදහනාගාර සහායක | 01 |
| 04 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 02 |
| 05 | සෞඛ්‍ය කම්කරු | 02 |

බඳවා ගන්නා අනුපාතය :

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | අදාළ නොවේ. |
| කුසලතා | අදාළ නොවේ. |

බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

***සුදුසුකම් :***

*අධ්‍යාපන සුදුසුකම් :*

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06ක් සමත් ව තිබීම. මින් විෂයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතුයි. මින් වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුර සහ සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා පමණක් ඉහත සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොමැති වුවහොත් 5 ශ්‍රේණිය සමත් වීම අවම සුදුසුකම ලෙස සැළකේ.

*කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුයි.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව පවතින පුරප්පාඩු වලට පත් කරනු ලැබේ. ලිඛිත විභාගය හෝ වෘත්තීය පරීක්ෂණය අදාළ නොවේ.

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය 100* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 | අදළ නොවේ. උපරිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු අනුව තෝරා ගනු ලැබේ. |
| පළපුරුද්ද | 55 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | 05 | |
| මුළු ලකුණුවල එකතුව | 100 | |

*පොදු කරුණු :*

*අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

1. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 18ට නොඅඩු සහ අවු. 45ට නොවැඩි විය යුතුය. දැනට ස්ථිරව සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.
2. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුය.
3. අයදුම්කරුවන් යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අවු. 03ක ස්ථිර පදිංචිකරුවන් විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.)
4. අයදුම්කරුවන් යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
6. සභාව දැනට ස්ථිර, තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
7. අයදුම්කරුවන් ඉහතින් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

03. *සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

i මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
ii පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
iii මෙම බඳවාගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා දෙපාර්තමේන්තු නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතුයි.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියවිලිවල පිටපත් ද එවිය යුතුය.

i. උප්පැන්න සහතිකයේ මුල් පිටපතක්
ii. අධ්‍යාපන සහතිකය
iii. මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්
iv. පදිංචිය සනාථ කිරීම සඳහා මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකයක්
v. සුදුසුකම් දක්වෙන සහතික
vi. පළපුරුද්ද දක්වෙන සහතික

*අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියල කරන ලද අයදුම්පත් 2018 ඔක්තෝබර් මස 15 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ, ලේකම්, යටිනුවර ප්‍රාදේශීය සභාව, ඇඹිල්මීගම, පිළිමතලාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමේ හෝ කැඳවන අතර තුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල යටිනුවර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

මෙහි සිංහල, දෙමළ භාෂා මාධ්‍යයන්ගෙන් පළවන නිවේදනයන්හි පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටකදී සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වේ.

ඩබ්. ඒ. එල්. ටී. ජයරත්න,
ලේකම්,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

2018 සැප්තැම්බර් මස,
යටිනුවර ප්‍රාදේශීය සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

යටිනුවර ප්‍රාදේශීය සභාව

*..............................තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. මුලකුරු සමග නම :—————————————.

02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————————————.

03. ස්ථිර ලිපිනය :—————————————.

04. ස්ත්‍රී /පුරුෂ බව :—————————————.

05. උපන් දිනයඃ අවුරුද්ද :————— මාසය :————— දිනය:—————

06 ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචියෙන්ද? :—————————————.

07. අධ්‍යාපන සුදුසුකම්ඃ

i. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයඃ
සමත් වර්ෂය හා විභාග අංකය :—————————————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

ii. වෙනත් සුදුසුකම් :—————————————.

08. වෘත්තීය සුදුසුකම් :—————————————.

09. සේවා පළපුරුද්ද :—————————————.

i. දැනට සේවය කරන ආයතනය :—————————
ii. දැනට දරන තනතුර :—————————
iii. එම තනතුරට පත් වූ දිනය :—————————
iv. පෙර සේවය කළ ස්ථානයේ දරන ලද තනතුර :—————————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා සාවද්‍ය තොරතුරු දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු බව සහ පත් වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

.............................................
අයදුම්කරුගේ අත්සන.

..............................
දිනය.

09-722

## ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

උපලේඛන **I**

### පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | **31.12.2017** | **31.12.2016** |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| සාමාන්‍ය මෙහෙයුම්වලින් ලද අතිරික්තය /ඌනතාවය | 25,420,109.63 | 56,603,856.44 |
| මුදල් නොවූ සිදුවීම් සඳහා ගැලපීම් (ජ'නල් 56) | 28,571.40 | |
| ක්ෂය වීම් | | |
| පාරිතෝෂික වෙන් කිරීම් | | |
| පෙර වර්ෂ සඳහා ගැලපීම් | -42,758,188.59 | 26,013,866.47 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය/ඌනතාවය** | -17,309,507.56 | 82,617,722.91 |
| තොග ණය ගැතියන්/අනෙකුත් ලැබීම් (වැඩිවීම්)/අඩුවීම් | 1,895,190.61 | -88,454,227.29 |
| ණය හිමියන්/ගෙවිය යුතු දෑ වැඩිවීම (අඩු වීම) | 33,826,072.61 | 33,382,728.69 |
| **01. මෙහෙයුම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **18,411,755.66** | **27,546,224.31** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| දේපළ (අත්පත් කර ගැනීම්)/ඉවත් කිරීම් | -3,594,625.73 | -18,522,455.80 |
| (ප්‍රාග්ධන වියදම්) | -157,098,797.63 | -67,329,726.79 |
| **02. ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **-160,693,423.36** | **-85,852,182.59** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| ප්‍රාග්ධන ලැබීම් | 136,801,373.78 | 66,459,574.39 |
| ණය ආපසු (ගෙවීම්)/ලැබීම් | -2,138,044.53 | -1,955,922.59 |
| **03. මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **134,663,329.25** | **64,503,651.80** |
| **වර්ෂය තුළ ශුද්ධ චලනයන් (1+2+3)** | -7,618,338.45 | 6,197,693.52 |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | 12,544,413.16 | 6,346,719.64 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන A)** | **4,926,074.71** | **12,544,413.16** |

සටහන A

| | | |
|---|---|---|
| මහජන බැංකු ජංගම ගිණුම - 163 | 4,349,532.01 | 12,052,953.77 |
| මහජන බැංකු ජංගම ගිණුම - 445 | 576,542.70 | 491,459.39 |
| | **4,926,074.71** | **12,544,413.16** |

ආර්. පී. ඩී. සුනිල් ජයවීර,
සභාපති,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව.

**උපලේඛන II**

2017.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

**පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව**

2017.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | *31.12.2017* | *31.12.2016* |
|---|---|---|
| වත්කම් : | | |
| *ජංගම වත්කම්* | | |
| දේපල පිරියත හා උපකරණ | 209,065,388.87 | 205,470,763.14 |
| තොගය | 4,773,519.71 | 4,666,088.00 |
| සේවක ණය හා අත්තිකාරම් | 11,089,944.41 | 9,705,226.77 |
| ලැබිය යුතු දෑ | 147,141,486.69 | 146,177,971.25 |
| ආයෝජන | 11,834,801.71 | 16,185,657.11 |
| මුදල් හා මුදල් සමාන දෑ | 4,926,074.71 | 12,544,413.16 |
| | 179,765,827.23 | 189,279,356.29 |
| මුළු වත්කම් : | 388,831,216.10 | 394,750,119.43 |
| වගකීම් | | |
| ජංගම නොවන වගකීම් | 13,694,444.04 | 15,832,488.57 |
| ජංගම වගකීම් | 128,560,751.55 | 94,734,678.94 |
| හිමිකම් | 246,576,020.51 | 284,182,951.92 |
| මුළු හිමිකම් හා වගකීම් | 388,831,216.10 | 394,750,119.43 |

ආර්. පී. ඩී. සුනිල් ජයවීර,
සභාපති,
පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව.

උපලේඛන III

පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව

2017 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන ගිණුම්කරණ සටහන්

| | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් | ජලසේවා සේවා | පොදු උපයෝගිතා පහසුකම් | සුභ සාධන සහ පොදු | 2017.12.31 | 2016.12.31 |
|---|---|---|---|---|---|---|---|---|
| සටහන 01 - රජයේ දයකත්වය පුනරාවර්ථන | | | | | | | | |
| 70 -පළාත් සභාව/පළාත් පාලන අමාත්‍යාංශය | 14,346,446.00 | 7,193,032.96 | 13,191,413.00 | 1,345,916.50 | 1,249,906.00 | 13,536,879.01 | 50,863,593.47 | 58,073,618.42 |
| එකතුව | 14,346,446.00 | 7,193,032.96 | 13,191,413.00 | 1,345,916.50 | 1,249,906.00 | 13,536,879.01 | 50,863,593.47 | 58,073,618.42 |
| සටහන 02 - වෙනත් අයභාර | | | | | | | | |
| 10 - වරිපනම් හා බදු | 1,788,721.52 | 1,507,450.00 | 0.00 | 0.00 | 0.00 | 480,403.20 | 3,776,574.72 | 3,764,210.72 |
| 20 - කුලී ආදයම් | 0.00 | 0.00 | 11,824,461.63 | 0.00 | 12,414,687.60 | 200,000.00 | 24,439,149.23 | 29,312,919.42 |
| 30 - බලපත්‍ර ගාස්තු | 279.00 | 1,303,002.00 | 0.00 | 0.00 | 0.00 | 3,000.00 | 1,306,281.00 | 1,195,658.91 |
| 40 - සේවා සඳහා ගාස්තු | 114,000.00 | 1,385,019.00 | 24,051,502.67 | 2,134,895.48 | 0.00 | 271,419.30 | 27,956,836.45 | 54,291,615.92 |
| 50 - දඩ හා වරෙන්තු ගාස්තු | 2,771,410.29 | 0.00 | 292,781.26 | 0.00 | 93,322.51 | 60,911.25 | 3,218,425.31 | 7,358,561.21 |
| 60 - වෙනත් ආදයම් | 2,044,585.61 | 309,875.00 | 1,419,039.85 | 5,101,598.54 | 823,237.12 | 20,820.20 | 9,719,156.32 | 5,376,432.52 |
| එකතුව | 6,718,996.42 | 4,505,346.00 | 37,587,785.41 | 7,236,494.02 | 13,331,247.23 | 1,036,553.95 | 70,416,423.03 | 101,299,398.70 |
| සටහන 03 - පුනරාවර්තන වියදම් | | | | | | | | |
| 01 - වැටුප් හා දීමනා | 12,233,850.60 | 12,399,329.63 | 12,173,414.58 | 969,526.60 | 1,203,963.23 | 17,354,678.94 | 56,334,763.58 | 56,325,634.75 |
| 02 - ගමන් වියදම් | 242,785.00 | 0.00 | 54,884.60 | 0.00 | 0.00 | 12,658.00 | 310,327.60 | 379,466.20 |
| 03 - සැපයුම් හා උපකරණ | 2,462,994.23 | 3,251,929.02 | 2,553,100.89 | 1,580,861.22 | 268,317.75 | 362,902.26 | 10,480,105.37 | 7,192,868.27 |
| 04 - ප්‍රාග්ධන වත්කම්, අලුත්වැඩියාව හා නඩත්තුව | 670,903.97 | 1,333,775.00 | 8,647,237.53 | 559,777.75 | 840,834.96 | 1,167,551.81 | 13,220,081.02 | 24,805,116.84 |
| 05 - ප්‍රවාහන සම්බන්ධතා, අවශ්‍යතා හා සේවා | 1,496,729.61 | 1,240,188.47 | 686,654.07 | 4,495,761.37 | 739,407.55 | 322,492.15 | 8,981,233.22 | 7,436,676.32 |
| 06 - පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 0.00 | 0.00 | 524,932.21 | 0.00 | 828,514.42 | 0.00 | 1,353,446.63 | 1,547,164.57 |
| 07 - ආධාර මුදල්, දයක මුදල් හා සහනාධාර | 507,219.81 | 174,457.50 | 0.00 | 0.00 | 2,760.00 | 4,210,877.81 | 4,895,315.12 | 4,848,121.70 |
| 08 - විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 93,474.78 | 191,159.55 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 284,634.33 | 234,112.03 |
| එකතුව | 17,707,958.00 | 18,590,839.17 | 24,640,223.88 | 7,605,926.94 | 3,883,797.91 | 23,431,160.97 | 95,859,906.87 | 102,769,160.68 |
| සටහන 04 - ප්‍රාග්ධන ආධාර - 80 | 227,355.77 | 3,598,108.51 | 120,388,471.83 | 12,142,930.47 | 0.00 | 444,507.20 | 136,801,373.78 | 66,459,574.39 |
| එකතුව | 227,355.77 | 3,598,108.51 | 120,388,471.83 | 12,142,930.47 | 0.00 | 444,507.20 | 136,801,373.78 | 66,459,574.39 |
| සටහන 05 - ප්‍රාග්ධන වියදම් - 09 | 2,193,292.13 | 10,262,491.62 | 129,882,509.27 | 13,225,267.55 | 500,000.00 | 4,629,862.79 | 160,693,423.36 | 85,852,182.59 |
| එකතුව | 2,193,292.13 | 10,262,491.62 | 129,882,509.27 | 13,225,267.55 | 500,000.00 | 4,629,862.79 | 160,693,423.36 | 85,852,182.59 |

ආර්. පී. ඩී. සුනිල් ජයවීර,
සභාපති,
පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.

09-439